# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,603 - 2009 මැයි මස 22 වැනි සිකුරාදා - 2009.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 662 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 663 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 666 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 මැයි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මැයි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

661 - B 080015— 9,115 (2009/05)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2009

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිල ගණන් 2009.06.10 දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවලදී භාරගනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම් පත්‍ර කාර්යාලයීය වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250 ක මුදලක් ගෙවා 2009.06.09 දින පස්වරු 12.00 වන තෙක් ලබාගත හැක.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් ලබාගත හැකි ස්ථානය* | *මිල ගණන් භාර ගැනීම* |
|---|---|---|---|---|
| උතුරු මැද | පොළොන්නරුව | මැදිරිගිරිය | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (උතුරු මැද පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (පොළොන්නරුව) | පළාත් ස්ර්වේයර් ජනරාල් කාර්යාලය (උතුරු මැද පළාත) 117-119 හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුරය. |
| ඌව | මොණරාගල | සියඹලාණ්ඩුව | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (ඌව පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (මොණරාගල) | පළාත් ස්ර්වේයර් ජනරාල් කාර්යාලය (ඌව පළාත) පල්ලිය පාර, බදුල්ල. |
| | අම්පාර | අක්කරපත්තුව | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (ඌව පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (අම්පාර) | |
| | බදුල්ල | බදුල්ල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (ඌව පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (බදුල්ල) | |
| බස්නාහිර | කොළඹ | මොරටුව | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (කොළඹ) | පළාත් ස්ර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත) සර්වේයර් ජනරාල් කාර්යාලය, 150, කිරුළ පාර, කොළඹ 05 |
| මධ්‍යම | මහනුවර | උඩුනුවර | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (මධ්‍යම පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (මහනුවර) | පළාත් ස්ර්වේයර් ජනරාල් කාර්යාලය (මධ්‍යම පළාත) බාන්ස් ගොඩනැගිල්ල, ගන්නොරුව, පේරාදෙණිය. |
| | මාතලේ | නාවුල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (මධ්‍යම පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (මාතලේ) | |

කවරයේ ඉහල වම් කෙළවර 'ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම - (ස්ථාන නාමය)' යනුවෙන් සඳහන් කරන ලද ඔබගේ මුද්‍රා තබන ලද මිල ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2009.06.10 දින පස්වරු 02.00 ට පෙර ලැබෙන සේ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම කළ හැක.

සර්වේයර් ජනරාල්.

කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

05-422

# රජයේ නොවන දැන්වීම්

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2009 මාර්තු 16 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ට්‍රේඩ් එල්කේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 67306
ලියාපදිංචි කාර්යාලය : අංක 104, කිතුල්වත්ත පාර, කොළඹ 08.

එස්. ජේ. කෝපරේට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

2009 අප්‍රේල් මස 06 වැනි දින,
4 වැනි මහල, අංක 2,
කාසල් පටුමග, කොළඹ 04.

05-382

---

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම : ඉෆෙක්ටිව් සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 67661
ලියාපදිංචි ලිපිනය : අංක එච්/2/11, ඇල්විටිගල මාවත, කොළඹ.

අධ්‍යක්ෂවරු.

05-377

---

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම : ඩබ්ලිව්. ඩබ්ලිව්. අයි. ඉන්ඩස්ට්‍රියල් ඉලෙක්ට්‍රිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 67636,
ලියාපදිංචි ලිපිනය : අංක 12, පරණ කිරුලපන පාර, නුගේගොඩ.

අධ්‍යක්ෂවරු.

05-376

---

## මහජනයා වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 වගන්තියේ 3 වැනි උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිග්මා හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම - ලියාපදිංචි අංකය 2748 සහ සිග්මා (එන්ජිනියර්ස් සහ මැනුෆැක්චරස්) සමාගම ලියාපදිංචි අංකය 2634 යන සමාගම් දෙක 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒකාබද්ධ තනි අස්තිතයක් වනු ඇත.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ අනුමැතිය අනුව 2009 අප්‍රේල් 1 වැනි දින සිට සිග්මා හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම ලෙස මෙම ඒකාබද්ධ සමාගම ක්‍රියාත්මක වනු ඇත.

සිග්මා හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම වන මෙම ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 32 බී, හෝර්ටන් පෙදෙස, කොළඹ 07 යන ස්ථානයෙහි පිහිටා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. වී. ආර්. ජෝසෆ්,
සමාගම් ලේකම්.

අංක 32 බී, හෝර්ටන් පෙදෙස,
කොළඹ 07.

05-375

---

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : ලංකා ෆෘට් ඇන්ඩ් වෙජිටබල් ප්‍රඩියුසස්, ප්‍රොසෙසස් ඇන්ඩ් එක්ස්පෝටස් ඇසෝසියේෂන්
සමාගමේ අංකය : ජී ඒ 2244
සංස්ථාගතකළ දිනය : 2009 මාර්තු 31
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 80, රෙක්ලමේෂන් පාර, කොළඹ 11.

අධ්‍යක්ෂ.

05-373

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2009 පෙබරවාරි මස 20 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ප්‍රගති සේවා පදනම
සමාගමේ අංකය : ජී. ඒ. 2233
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 260, ෂාරවස්තිවත්ත, ෂාරවස්තිපුර, අනුරාධපුරය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-418

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මෙහි පහත අත්සන් කරන වියා -ඔර්සිනි, 70, 20157, මිලානෝ, ඉතාලිය යන ලිපිනයෙහි පදිංචි නිහාල් දිමිංගුවා වඩුගේ වන මා විසින් ඉතාලියේ අංක 24-20124, මිලානෝ යන ලිපිනයෙහි ක්‍රියාකරන ප්‍රසිද්ධ නොතාරිස් ඇන්ඩ්‍රියා ග්‍රැන්ඩි විසින් 2007.09.17 දාතමින් සහතික කරන ලද අංක 77 එෆ් මාතම්මන, මිනුවන්ගොඩ පදිංචි දයාවති පිංසිලි ලැනරෝල් යන අයට දෙනු ලැබූ ඇටෝර්නි බලපත්‍රය 2009.02.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාවටත් මෙයින් දන්වනු ලැබේ.

නිහාල් දිමිංගුවා වඩුගේ.

05-426

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2009 අප්‍රේල් මස 20 වැනි දින සංස්ථාගත කරන ලදී :

සමාගමේ නම : එක්ස්ප්ලෝසිවුස් කන්සල්ටේෂන් ඇන්ඩ් ඇප්ලිකේෂන් කලම්බො (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 67586
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 385/3, 'මීනා', කෝට්ටේ පාර, කෝට්ටේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-419

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ 'සෙන්ට්‍රල් ප්‍රොවින්ස් එක්ස්පොටර්ස් චේම්බර්' යන සමාගම ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් වර්ෂ 2009ක් වූ අප්‍රේල් මස 29 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සෙන්ට්‍රල් ප්‍රොවින්ස් එක්ස්පොටර්ස් චේම්බර්
සමාගමේ අංකය : ජී. ඒ. 2253
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 228/2, ඩී. එස්. සේනානායක මාවත, මහනුවර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතුව

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

05-351

## මහජනයා වෙත කෙරෙන නිවේදනය

වර්ෂ 2002, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ වූ විධි විධාන අනුව, පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් නිවේදනය කෙරේ :-

සමාගමේ නම : සී/ස. S. K. S. Holdings (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 67647
ලියාපදිංචි කාර්යාලය : ද පාර්ක්වේ බිල්ඩිං, 5 වැනි මහල, අංක 48, පාර්ක් වීදිය, කොළඹ 08
සංස්ථාපිත කළ දිනය : 2009 අප්‍රේල් මස 27 වැනි දින.

සමාගම් ලේකම්වරු,
සී/සංයුක්ත උපදේශන සේවා (පුද්ගලික).

05-334

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඕස්ට්‍රේලියා අංක 67 තොලිවේ ලෙක්රිච් ඩබ්ජ් 6054 හි ස්ටැනිස්ලෝස් සැමුවෙල් හාමර් වන මා ඇටෝර්නි අධිපති හැටියට දෙහිවල අංක 24 පීටස් ලේන් පදිංචි, විවිල් සින්ක්ලෙයා ඕබ්‍රියෙල් පෙරේරා යන අය අතිරේක කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 267 කාණ්ඩය 83 වැනි පත්‍රිරුවේ 2004.12.03 දින ලියාපදිංචි කර ඇති සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය බල රහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින්පසුව ඇය විසින් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට බලයකට ඔප්පුවකට හෝ කරුණකට ඇය වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

ස්ටැනිස්ලෝස් සැමුවෙල් හාමර්.

05-425

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඉංගිලාන්තු, කම්බර්ලි, ජීයු 15 3 පියු සවුත්තවල් පාර්ක් රෝඩ්, ට්‍රාපොට් දැනට ගල්කිස්ස සයිමන් අබේවික්‍රම පාර අංක 25 හි කුමාර සුවාමි සිතරන්ජන් වන මම සොලිසිටර් හා දිවුරුම් පරිපාලක ඉන්ට්‍රාලෝජිනි සෙබස්ටියන් විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බවට මෙයින් ප්‍රකාශ කර සිටින අතර ඒවායේ මොනයම් හෝ නෛතික බලයක් හෝ බලපෑමක් නැතිබවත් එකී ඇටෝර්නි බලපත්‍ර මෙයින් අවලංගු කරන අතර එකී ඇටෝර්නි බලපත්‍රය සඳහන් ඉංගිලාන්තු ලන්ටන් ඇස්. ඩබ්ලිව් 19 7 කියු ඒ, කොම්ටන් පාර අංක 49 හි නල්ලතම්බි පරමසිවම් විසින් කරනු ලබන මොනයම් හෝ ක්‍රියාවක් ගැන මම වග නොකියන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

කුමාරසුවාමි සිතරන්ජන්.

05-459

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ -

සමාගමේ නම : විෂන් මාකටිං ඇන්ඩ් ප්‍රින්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 67415
සංස්ථාගත කළ දිනය : 2009 මාර්තු 26
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 73 බී, මරදාන පාර, හැඳල, වත්තල.

ලේකම්වරුන්.

05-450

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ -

සමාගමේ නම : ඒසියන් මාකටිං ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 67493
සංස්ථාගත කළ දිනය : 2009 අප්‍රේල් 02
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 6 ඒ, ශ්‍රී සුනන්දාරාම පාර, කළුබෝවිල, දෙහිවල,

ලේකම්වරුන්.

05-449

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය යටතේ -

සමාගමේ නම : ඒ ත්‍රී ඉන්ටර්නැෂනල් ලොජිස්ටික්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 67697
සංස්ථාගත කළ දිනය : .2009.05.04
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 58/72, 1 වැනි පටුමග, සෝමතලාගල මාවත, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික),
ලේකම්වරු.

2009 මැයි මස 06 වැනි දින,
අංක 96- 2/2 මල්වත්ත පාර,
කොළඹ 11,

05-454

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

යුනයිටෙට් කිංටොම්, කම්බර්ලි, ජියු 15 3 පියු සවුත්වෙල් පාර්ක් පාර, 'ට්‍රාපොට්', දැනට ගල්කිස්ස සයිමන් අබේවික්‍රම පාර, අංක 25 හි කුමාරසාමි සිතරන්ජන් වන මම සොලිසිටර් හා දිවුරුම් පරිපාලක චිත්‍රා සෝමසුන්දරම් විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බවට මෙයින් ප්‍රකාශ කර සිටින අතර ඒවායේ මොනයම් හෝ නෛතික බලයක් හෝ බලපෑමක් නැති බවත් එකී ඇටෝර්නි බලපත්‍ර මෙයින් අවලංගු කරන අතර එකී ඇටෝර්නි බලපත්‍රය සඳහන් යුනයිටෙට් කිංටොම්, ඇස්. ඩබ්ලියු 19 7 කියු. 'ඒ', ලන්ඩන් විම්බිල්ඩන්, කොම්ටන් පාර අංක 49 හි නල්ලතම්බි පරමසිවම් විසින් කරනු ලබන මොනයම් හෝ ක්‍රියාවක් ගැන මම වග නොකියන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

කුමාරසාමි සිතරන්ජන්.

05-458

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කහදූව, මිරිස්වත්ත පදිංචි (657930628 V ) මත්තක ගමගේ සිරියලතා යන අයට වර්ෂ 2008 ක් වූ ජුනි මස 23 වැනි දින මුනිදාස හාල්පදෙණිය නොතාරිස් මහත්මා විසින් සහතික කරන ලද අංක 976 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

උදයංග සුසිත ගලබොඩආරච්චි,
මිරිස්වත්ත,
කහදූව.

2009 මැයි මස 06 වැනි දින.

05-461

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ජුනි මස 13 වැනි දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල උප කාර්යාල සීමාව තුල කලපලුවාවේ පිහිටි රුවන්පුර පාර තැපැල් අංකය 500/30 සහ වරිපනම් අංකය 27/58 දරන දැනට ඒකාබද්ධ කොට එක් ඉඩමක් වශයෙන් දැක්වෙන මිල්ලගහවත්ත, කිරිපැල්ලගහවත්ත, බටදොඹගහවත්ත, පලන්කඩදෙණිය. පහලහේන, තුන්හවුල් කිරිපැලගහ කුරුදුවත්ත, ඇත්තොටුවේහේනවත්ත සහ කොරගහවත්ත ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද අංක 2265 සහ 1962 අප්‍රේල් මස 19 වැනි දිනැති සැලැස්මේ ලොට් 114 දරන බිම් කැබැල්ල, ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 20.00).

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් සහතික කරන ලද අංක 806 සහ 2005 ජූලි මස 22 සහ අංක 939 සහ 2006 මාර්තු මස 24 වැනි දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම රංජිත්ලාල් සෝමසිරි හික්කඩුව විතාන විසින් ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් සහතික කරන ලද අංක 1185 සහ 2007 ජනවාරි මස 11 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම රජිත ඇක්වේරියම්හි තනි අයිතිකරු වන රංජිත්ලාල් සෝමසිරි හික්කඩුව විතාන විසින් පැහැර හැර ඇති හෙයින් එකී රංජිත්ලාල් සෝමසිරි හික්කඩුව විතාන විසින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.05.15 වැනි දින ඩේලිනිවුස්, ලක්බිම සහ සුඩර් ඔලි පුවත්පත් සහ *ගැසට් පත්‍රය* බලන්න.

(බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම, 2009.05.07 වන දින සංශෝධනය කරන ලදී)

*දේපලට පිවිසෙන මාර්ගය* :- රාජගිරිය කලපලුවාව රුවන්පුර පාරෙහි පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. ප්‍රචාරක වියදම් ද,
6. ලිපිකරු හා සෝෂක ගාස්තුව ද,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුලත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාල ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජොෂ්ඨ කළමනාකරු නීති, පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී, ප්‍රධාන කාර්යාලය, අංක 450 ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 2565573/2565565.

ශ්‍රියානි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, සහ බ්‍රෝකර්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 09, බෙල්මන්ට් වීදිය, කොළඹ 12,
දුරකථන අංක : 011-2320074, හෝ 0713- 151356

05-457/2

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ජුනි මස 16 වන දින පෙ.ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුල කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 කොල්ලුපිටියේ පිහිටි ගාලු පාර වරිපනම් අංක 288 ඒ දරන 'අනෝමා' නමැති (බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් මැන සාදන ලද අංක 563 සහ 1972 මාර්තු 30 දිනැති සැලැස්මේ ලොට් 1 ඒ දරන බිම් කොටසේ යලි මැනුමක් වන) ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් මැන සාදන ලද අංක 1413 සහ 2004 සැප්තැම්බර් 07 දින දරන සැලැස්මේ ලොට් 1ඒ දරන බිම් කැබැල්ල ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 7.75)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජයන්ත ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2083 සහ 2006 මැයි මස 26, 2084 සහ 2006 මැයි 26, 2106 සහ 2006 ජුනි 15, 2197 සහ 2006 සැප්තැම්බර් 14, 2267 සහ 2007 ජනවාරි 9, 2309 සහ 2007 මාර්තු 08 සහ 2313 සහ 2007 මාර්තු 08 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එනම් මොඩ් ටෙක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඞ් විසින් උකස් කරන ලද දේපළ

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.05.14 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම සහ සුඩර් ඔලි පුවත් පත් සහ 2009.05.15 වැනි දින *ගැසට් පත්‍රය* බලන්න. (බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම 2009.05.07 වන දින සංශෝධනය කරන ලදී.)

*දේපළට පිවිසෙන මාර්ගය*.- කොල්ලුපිටිය හන්දියේ සිට ගාලු පාර දිගේ බම්බලපිටිය දෙසට මීටර 150 ක් පමණ ගමන් කල විට පාරෙහි දකුණු පස 19 වැනි පටුමගට පසුව විකිණීමට නියමිත ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ විගස ගැනුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මුදලෙන් 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තුද,
5. ප්‍රචාරක වියදම් ද,
6. ලිපිකරු හා සෝෂක ගාස්තුව ද,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුලත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජ්‍යෂ්ඨ කළමනාකරු නීති පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2665573, 2565565.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු, සහ බ්‍රොකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011-2320074 හෝ 0713-151356

05-457/1

---

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මහජන බැංකුව, කලාප කාර්යාලය (බටහිර කලාප 1) සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථනය : 2393678, 2387068, ෆැක්ස් : 2435977

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

*කාර්යාලය :* අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12,
දුරකථනය : 011-5756356
*නිවස :* අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථනය : 011-2419126

05-455

---

## මහජන බැංකුව - සමුද්‍ර වීදිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ හැඳල නගර සභා සීමාව තුල හැඳල වරිපනම් අංක 15, කොන්වන්ට් ලේන්හි පිහිටි, 'දෙවටගහමූකලාන' නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම පහයි නමයක් (අ. 0, රූ. 0, පර්. 20.59) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ ඊට අයත් සියලු දේ, මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009 ක් වූ ජූනි මස 14 වන දින පෙ.ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2008.12.19 දිනද, දිනමිණ, ඩේලිනිව්ස්, සහ තිනකරන් පුවත්පත් වල 2008.12.04 දිනද, පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.-* කොළඹ මීගමුව පාරේ, වත්තල හංදියෙන් වම්පසට ඇති ඇලකන්ද පාරේ නායකකන්ද හංදිය දක්වා ගොස් එතැනින් වම්පසට ඇති කොන්වන්ට් පාරේ කි. මී. 01 ක් පමණ ඉදිරියට ගියවිට හමුවන හතරමං හන්දියෙන් යලි දකුණට හැරෙනවාත් සමගම එම පාරේ වමතට පිහිටි දෙවන නිවස.

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

මැනික්හින්න, දිඹුලගාවතැන්න, අංක 135 දරන ස්ථානයේ පදිංචි වෙලපාල ගමගේ රවීන්ද්‍ර පුෂ්පකුමාර ගමගේ මයා විසින් උකස් කරන ලද දේපළ

ණය යොමුව : එම්ඩීඩබ්ලිව්/154/03/එල්එන් හා
එම්ඩීඩබ්ලිව්/156/03/එල්එන්.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.02.13 දිනැති අංක 1589 දරන *ගැසට් පත්‍රයේ* හා 2009.02.02 දිනැති දිනමිණ, තිනකරන් හා ඩේලිනිවුස් යන පුවත්පත්වල පළකරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය, ගාස්තු හා එකී ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේදී 2009.06.11 වැනි දින පෙරවරු 11.00 ට මහනුවර,

ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළේ, අතරගල්ල හි පිහිටි, බලයලත් මිනින්දෝරු පී. වී. සිරිසුමන මහතා විසින් සාදන ලද 2002 මැයි මස 2 හා 3 දිනැති අංක 2629 දරන පිඹුරේ කැබලි 27 යනුවෙන් පෙන්නුම් කර ඇති, අංක 1905 ඒ දරන පිඹුරේ කැබලි 1 දරන 'උඩ කනත්ත ගැඩුමගොල්ල හේන' යයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන, එකී කැබලි 27 ට, උතුරට : කැබලි අංක 28 ද, නැගෙනහිරට හා දකුණට : පාර ද, බස්නාහිරට : අංක 26 දරන කැබැල්ල ද මායිම් වූ, පර්චස් දහයක (අක්. 0, රූ. 0, පර්. 10) හෙවත් හෙක්ටයාර් 0.0253 ක ප්‍රමාණයෙන් යුත් එකී පිඹුරේ අංක 13 දරන කැබැල්ල මත වූ පාර අයිතිය ද සමග, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහි ඇති සෑම සියලු දේත් වේ.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩමේ කොටසක් වේ :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර, උඩගම්පහ කෝරළේ, පල්ලේගම්මැද්ද, අතරගල්ල හි පිහිටි, බලයලත් මිනින්දෝරු පී. ඩබ්. විජේවර්ධන මහතා විසින් සාදන ලද 1980.03.07 දිනැති අංක . 1905 ඒ දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති 'උඩකන්දගැඩුමගොල්ල' යයි හඳුන්වනු ලබන, උතුරට : තෙල්දෙනියට යන මහ පාර ද, නැගෙනහිරට : කැබලි 2 ද, දකුණට : ගලේදන්ද වත්ත ද, බස්නාහිරට : මීයන්වෙට්ටිගේ වත්ත ද මායිම් වූ අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දොළහයි දශම තුනක (අක්. 2, රූ. 3, පර්. 12.3) වපසරියකින් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ ඇති වගාවන් හා සෑම සියලු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 506/211 දරන පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඒ. ඩබ්. ජයසුන්දර මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
මඩවල ශාඛාව.

05-448

---

**මහජන බැංකුව - හික්කඩුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009 ජුනි මස 24 වැනි දින පෙ.ව. 11.00 ට මෙහි පහත විස්තර වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස්කරන ලද දේපොළ පිළිබඳ විස්තරය**

01. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ පටුවත පිහිටි වෙරළබඩ මිදිගහවත්ත නමැති ඉඩමේ ඒකාබද්ධ කැබලි වන ඒ, 2ඒ සහ 3 ඒ දරන පර්. 39.4 ක් විශාල ඉඩම සියලු වැවිලි හා ගොඩනැගිලි ද සමග වේ.

02. ඉහත කී පටුවත පිහිටි වෙරළබඩ මිදිගහවත්තේ ලොට් 5 හි ලොට් ඩී වලින් බෙදා වෙන් කළ ලොට් 01 දරන පර්. 32.833 ක් විශාල ඉඩම සියලු වැවිලි හා ගොඩනැගිලි ද සමග වේ.

වැඩි විස්තර සඳහා 1995.12.15 දින රජයේ ගැසට් පත්‍රයේ ද 1995.12.01 දින දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපොළට පිවිසීම.*- කොළඹ සිට ගාල්ල දෙසට ගමන් කිරීමේ දී දොඩන්දූව පටුවත ප්‍රදේශයේ දී හමුවන ඕෂන් බීච් ක්ලබ් හෝටලය අසල (මෙයට පෙර. කි. මී. 102 කනුව අසල) පාරේ මුහුදු වෙරළ ඉදිරිපිට මෙම දේපොළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි ගෙවීම් කළ යුතුය :-

01. ගැනුම් මිලෙන් 10% ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1% ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්ද,
05. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත ගාල්ලේ පහළ ඩික්සන් පාරේ අංක 22 හි පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091- 2223563, 2232311, 2234171 හා 2234174
ෆැක්ස් අංකය : 091 - 2232230
හිමිකම් ඔප්පුව හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැනුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුදුවත්ත,
වල්ගම,
මාතර,
දුරකථන අංකය : 041-22287

05-399

## මහජන බැංකුව - මන්නාරම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මන්නාරම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මන්නාරම නගරයේ අලමරා වීදියේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ල බලයලත් මානක ඒ. එස්. කොඩුතොරේ විසින් 1983 පෙබරවාරි මස 26 වැනි දින සාදන ලද අංක 12 දරන පිඹුර සඳහන් ඉඩමට මැතක දී බලයලත් මානක පී. එන්. සුහුමාර් විසින් සාදන ලද 2004 ජනවාරි මස 24 වැනි දින අංක 2401 MN දරන පිඹුරේ සඳහන් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ප්‍රමාණය : පර්චස් 2.17

මෙම දේපළ, සචින්ද්‍ර රාජා රංගරාජා, රංගරාජා යෝගම්මා සහ රංගරාජා තවරාජන් යන අය ණයකරුවන් ලෙසට මහජන බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම*.- මන්නාරම මහජන බැංකු ශාඛාව සිට අලමරා වීදිය ඔස්සේ බටහිර දෙසට මීටර් 100 ක් පමණ ගමන් ගත් විට මෙම වීදියට මුහුණලා වම් දෙසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2009 ක් වූ ජූනි මස 22 වැනි දින ප.ව. 1 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.01.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.01.07 වැනි දින ඩේලිනිවුස්, 2009.01.07 වැනි දින දිනමිණ හා 2009.01.07 වැනි දින තිනකරන් යන පුවත්පත් බලන්න. එමෙන්ම විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.05.22 වැනි දින *ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2%(සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු.2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී මහජන බැංකුව මන්නාරම ශාඛාවට හෝ වව්නියාව ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රාදේශීය කළමනාකරු (වන්නි), මහජන බැංකුව, අංක 9 1/1, දුම්රියපොළ පාර, වව්නියාව. දුරකථන අංකය : 024 -2222972.

ඉහත සඳහන් කළ පරිදි 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළතදී නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10%ක මුදල අහිමි වන අතර එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974, ෆැක්ස් අංකය : 081-2211025

05-383

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
## (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කෙරෙන වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 514 සහ 2006 මැයි මස 30 වැනි දිනැති උකස් බැඳුම්කරය මත කිඹුලාපිටිය, රුක්අත්තන හංදිය උළුඅම්බලම්වත්ත අංක 212/117 දරන ස්ථානයේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ හසිත බණ්ඩාර යන අය විසින් ඉහත කී බැංකුවට උකස්කර ඇති බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලයේ උඩුගහපත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත නඹදලුව ගමේ පිහිටි දඹුගහලන්ද හෙවත් දඹුගහවත්ත හෙවත් මිල්ලගහහේන හෙවත් දොඹගහලන්ද හෙවත් දොඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද අංක 8355 සහ 2002 ජූලි 10 දිනැති පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 2 දරන පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි, පස්, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 264/55 දරන හිමිකම් වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී දිසානායක මුදියන්සේලාගේ හසිත බණ්ඩාර යන අය විසින් ඉහත කී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ඉහත සඳහන් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව වර්ෂ 2009 ජූනි 12 දින පෙ.ව. 11.30 ට ආරම්භව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.03.26 දින දිනපතා දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද 2009.04.03 දින රජයේ *ගැසට් පත්‍රය*ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුය:-

1. ගැණුම් මිලෙන් 10% ක් (ගැණුම් මිලෙන් ඉතිරි 90% සහ ගැනුම් මිල මත අයවිය යුතු ව්‍යවස්ථාපිත හා අනෙකුත් සියලු බදු සමග වෙන්දේසියේ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.),
2. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාළ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය,
3. ගැණුම් මිලෙන් 2.5 ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය,
4. ප්‍රචාරක ගාස්තුවලින් 50% ක් ගෙවිය යුතුය,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 යි,
6. නොතාරිස් ගාස්තු රු. 2500 යි.

හිමිකම් ඔප්පු සහ වෙනත් ලියවිලි කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවත, අංක 256 දරන ස්ථානයේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ දී පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 011-4682403/0773918733

එන්. ඩී. ඩී. සේනානායක,
ට්‍රියැඩ් ඔක්ෂනියර්ස්.

අංක 155/1, දෙහිවල පාර,
බෙල්ලන්විල.
දුරකථන අංක : 2724133, 2731317

05-416/1

**සෙලාන් බැංකුව පීඑල්සී - උපාධිධාරී ව්‍යවසායකත්ව ණය පරිපාටිය**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ මුන්වත්තේබාගේ පත්තුවේ ගුංගමුව පිහිටි බලයලත් මිනින්දෝරු එච්. බී. ශරෙන්ගුයිවාල් විසින් සාදන ලද 1935.02.14 දිනැති අංක 6301 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නාගස්ගොඩැල්ලේ වත්ත නමැති ඉඩමේ ලොට් 03 ලකුණු කළ ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම තුනක් (අ. 0, රූ. 1, පර්.4.3) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. පහත සඳහන් වනුයේ ඉහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ මුන්වත්තේබාගේ පත්තුවේ ගුංගමුව පිහිටි බලයලත් මිනින්දෝරු සී. වික්‍රමගේ විසින් සාදන ලද 2005.07.24 දිනැති අංක 6262 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නාගස්ගොඩැල්ලේවත්ත නමැති ඉඩමේ ලොට් 3 ඒ ලකුණු කළ ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තුනයි දශම අටක් (අ. 0, රූ. 1, පර්. 3.8) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙම දේපළ බණ්ඩාරගම ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව් එස්එස්/269 දරන දෙළුම් එන්ටර්ප්‍රයිසස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන විතානගේ පුන්නියදාස හෙවත් පුන්‍යදාස විතානගේ සහ සේනාධීර පතිරණලාගේ නිශාන්ති යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2009 ජූනි මස 11 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2009.02.06 වැනි දින පළ වී ඇති අතර ඩේලිමිරර් හා ලංකාදීප පුවත්පත්වල 2009.01.26 සහ 2009.01.27 වැනි දින ද වීරකේසරී පුවත්පතේ 2009.01.23 සහ 2009.01.27 වැනි දින පළ වී ඇත.

*දේපළට පිවිසීම.*- බණ්ඩාරගම ඔරලෝසු කණුව මංසන්ධියේ සිට පානදුර - හොරණ ප්‍රධාන මාර්ගයේ හොරණ දෙසට කි. මී. 4 ක් පමණ ඉදිරියට ගිය විට ප්‍රධාන මාර්ගයට මායිම්ව පාරේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත. දෙව්මිණි එන්ර්ප්‍රයිසස් නමැති මෙම ව්‍යාපාරික ස්ථානයට මෝටර් රථ ගමන් කළ හැකි මාර්ග පහසුකම් ද ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%වන පළාත් අධිකාරී බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සොලන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 060-2068185, 011-2696155, 011-2572940.

05-417

---

**මහජන බැංකුව - ගාල්ල මහවීදිය ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.06.10 දින පෙ.ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපොළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ හාලිවල ගමේ පිහිටි හාලිය දෙනිදූව හෙවත් දෙල්ගහදූව කැබැල්ල බෙදාවෙන්කළ පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 10.50) විශාල අංක 03 දරන ඉඩම හා එහි පිහිටි ගහකොළ පළතුරු සහ ගොඩනැගිලි ද වේ.

වැඩි විස්තර සඳහා 2008.01.18 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2008.03.24 දින දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසෙන මාර්ගය.- ගාල්ල සිට උඩුගම පාරේ සැතපුම් 03 ක් පමණ ගොස් වම්පසට ඇති බටදූව ඩී. එස්. අයි කර්මාන්තශාලාව දෙසටවූ පාරේ සැ. 1/2 ක් ගියවිට වමට ඇති පාරේ කන්ද පසුකර ඉදිරියට ගියවිට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැනුම් මිලෙන් 10% ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1 % ක්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැනුම් මිලෙන් 2 1/2% ක්ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්ද,
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත ගාල්ල පහල ඩික්සන් පාරේ අංක : 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2232311, 2234785, 2234171, 2223564,
ෆැක්ස් අංකය : 091-2232230.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

පී. පී. ආනන්ද, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම - මාතර
දුරකථන අංකය : 041-2228731

05-393

---

**ඩී එෆ් සී සී බැංකුව**

වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ විකිණීම

**අංක 315 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාවට අයත්, මාපනා වතුරෙහි පිහිටි, බලයලත් මිනින්දෝරු පී. නානායක්කාර විසින් සකසන ලද 1989 දෙසැම්බර් මස 20 වැනි දින දරන පිඹුරුපත් අංක 648 හි ලොට් අංක 1 B, 2, B 3 ලෙස බෙදා වෙන් කරන ලද 'ගැටගහමුලේවත්ත' ලෙස හැඳින්වෙන ඉඩම.

*ඉඩමේ ප්‍රමාණය :*
ලොට් අංක - 1 B : අක් 0 : රූඩ් 0 : පර්චස් 25.5
ලොට් අංක - 2 අක් : 0 රූඩ් . 0 පර්. 34
ලොට් අංක - 3B : අක් : 0 රූඩ් : 0 පර්. 29.5

එහි පිහිටි ගස්වැල්, වැවිලි පස් සහ එහි අඩංගු සියල්ල මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රී විසින් සහතික කරන ලද 2006 ජූලි මස 27 වැනි දිනැති, අංක 315 දරන උකස්කරය ප්‍රකාර මහනුවර පදිංචි ටිකිතන්තිරි හෙසාමිලාගේ පණ්ඩුල ගුණසේකර හෙවත් ටිකිතන්ත්‍රී මහසාමිලාගේ පණ්ඩුල ගුණසේකර යන අය විසින්, ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 ජුනි මස 10 වෙනි දින (බදාදා) ප.ව. 3.30 ට ඩී එෆ් සී සී බැංකුව නුවර ශාඛාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 31,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න : දුරකථන අංක 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24 ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk.

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com.

05-444

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කෙංගල්ල, කෙංගල්ල වීදියේ පදිංචි මන්තිලක මුදියන්සේලාගේ චිත්‍රා ශ්‍රීමති මන්තිලක මිය විසින් උකස්කරන ලද දේපල.

ණය යොමු අංකය : ඩීඅයිජී/109/2000.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.08.01 දිනැති අංක 1561 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.07.23 දිනැති 'දිනමිණ', 'තිනකරන්' හා 'ඩේලිනිවුස්'

යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය, ගාස්තු හා එකී ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපොල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2009.06.10 වැනි දින පෙරවරු 11.00 ට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත දුම්බර උඩ ගම්පහ කෝරළේ, කෙංගල්ල හි පිහිටි 'කඩාවැටිච්චි කුඹුරේ වත්ත' හෙවත් 'කහටගහ කුඹුරේ පහත ඇස්වැද්දුම් මඩිතිකඩේ' යයි හඳුන්වනු ලබන, උතුරට : උනා අබ්දුල් හමීඩ් ගේ කුඹුර ද, නැගෙනහිරට : ඇල ද, දකුණට : ඇල ද, බස්නාහිරට : පල්ලේකැලේ වත්තේ ඉඩම ද, මායිම් වූ වී පැල් තුනක් වැපරිය හැකි හෙවත් රූඩ් දෙකයි පර්චස් හතරක (අක්. 0, රූ. 02, පර්. 04) ප්‍රමාණයෙන් යුත් ඉඩම් සියල්ල හා එහි තුළ ඇති සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 318/282 පිටුවේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම අළුතින් මනින ලදුව පහත පරිදි විස්තර කර ඇත.

